

හීනටිගල සාරිපුත්ත මහා විද්‍යාලයේ (වම් පස) සහ ගාල්ල මහින්ද විද්‍යාලයේ වැඩසටහන් පැවති අවස්ථා...


fpa SRI LANKA
enriching relationships

# පුවත් සංග්‍රහය

2010 තුන්වන කලාපය

www.fpasrilanka.org


## සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථ (MDG) - 5b ජය ගැනීම...

# Lisa 2010 ව්‍යාපෘතිය එක්සත් ජාතීන්ගේ ඇගයීමට



එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නියෝජිත කොනී කාමරා මහත්මිය, විධායක අධ්‍යක්ෂ ගාමිණී වනසේකර මහතා ඇතුලු පිරිස සමඟ



නියෝජ්‍ය විධායක අධ්‍යක්ෂ ලසන්ත ගුණරත්න මහතා සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ ආර්. වී. පී. රාජපක්ෂ මහතා නියෝජිතවරිය සමඟ

**උතුරු පළාතේ යුධ වාතාවරණය හේතු කරගෙන අභ්‍යන්තරව අවතැන්වූ කඳවුරුවල වෙසෙන ගැබිණි මව්වරුන්ට සහ ළදරුවන්ට සෞඛ්‍ය සේවා ලබාදීම සඳහා ක්‍රියාත්මක කරන ලද Lisa 2010 ව්‍යාපාතියේ කටයුතු එක්සත් ජාතින්ගේ සංවිධානයේ විශේෂ නියෝජිතවරියගේ ඇගයීමට ලක්වූවාය.**

Lisa 2010 ව්‍යාපෘතිය ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමය මඟින් ක්‍රියාත්මක කරනු ලබන්නේ, එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදලේ (UNFPA) මූල්‍ය අනුග්‍රහයෙනි.

2010 වර්ෂය තුළ විශේෂයෙන් ම සෙට්ටිකුලම ප්‍රදේශයේ පිහිටි කඳවුරුවල ගැබිණි මව්වරුන් සඳහාම සකස්කරන ලද ගර්භනී සමයේදී ප්‍රයෝජනවත් වන ද්‍රව්‍ය සහිත කට්ටල බෙදදීම ද ඊට අමතරව තරුණ කාන්තාවන් සඳහා සනීපාරක්ෂක ද්‍රව්‍ය සහිත කට්ටල බෙදදීම ද සිදුවිය.

5 පිටුවට...

## තරුණ ප්‍රජාවට...

මේ ගත වන්නේ (2010-2011) ජාත්‍යන්තර තරුණ වර්ෂයයි. ලොව පුරා තරුණ ප්‍රජාව පිළිබඳව වඩාත් අවධානය යොමු කරනු ලබන මෙම වකවානුවේ ඒ සඳහා අපගේ ක්‍රියාකාරීත්වයද එක්කර ඇත.

**ආලෝකය යොවුන් මිතුරු සුව සේවා මධ්‍යස්ථාන** හතරක් කොග්ගල, අම්පාර, මඩකලපුව සහ කොළඹ මේ වන විටත් ආරම්භ කරමින් තරුණ ප්‍රජාවට සේවා රැසක් ලබා දීමට කටයුතු කර තිබේ. තරුණ ප්‍රජාවට උපදේශන සේවා, ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය උපදෙස් ලබා දීමට අමතරව ඔවුන්ගේ ජීවන කුසලතා ඔප්නැංවීමට මෙමඟින් කටයුතු කෙරේ.

අම්පාර හා මඩකලපුව දිස්ත්‍රික්කවල ක්‍රියාවට නැංවෙන **ලිය සවිය** ව්‍යාපෘතිය මඟින් නව යොවුන් වියේ තරුණියන් 2500ක් සඳහා ප්‍රජනක සෞඛ්‍ය පිළිබඳ දැනුවත් කිරීම මේ වනවිට ඉතා සාර්ථකව සිදු වෙමින් පවතී.

ජ්‍යෙෂ්ඨ බාලදක්ෂිකාවන් සඳහා, ආබාධිත රණවිරුවන් සඳහා සහ ඇඟලුම් කර්මාන්තශාලාවල තරුණ තරුණියන් සඳහා විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ.

මේ සෑම අවස්ථාවකදීම සහ වැඩසටහනකදීම විශේෂයෙන්ම HIV /Aids පිළිබඳව සහ එය වලක්වාගැනීම පිළිබඳවද තරුණ ප්‍රජාවගේ අවධානය යොමු කිරීමට විශේෂ සැලකිල්ලක් දක්වන ලදී. ඊට අමතරව තරුණ ප්‍රජාව ඉලක්ක කර ගනිමින් අත්‍යවශ්‍ය ප්‍රජනක සෞඛ්‍ය කරුණු ඇතුලත් පොත පත සංස්කරණය කිරීමටද ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමය මුලපුරා ඇත.

HAPPY LIFE

## වෙබ් අඩවියට පළමු ස්ථානය

**LK Domain Registry** මගින් පවත්වන ලද ශ්‍රී ලංකාවේ ජනප්‍රියතම වෙබ් අඩවි තේරීමේ තරගයේදී **happylife.lk** සඳහා සම්මාන 2 ක් හිමිවිය. ලාබ නොලබන අංශය යටතේ හොඳම වෙබ් අඩවි සඳහා (විනිශ්චය මණ්ඩලයක් මගින් තෝරා ගැනීම) සහ ජනප්‍රියම සිංහල වෙබ් අඩවි 10න් එකක් සඳහා (පාඨක ඡන්දය මගින්) වන සම්මාන හිමිවිය.




ගරු සභාපතිනි විශේෂඥ වෛද්‍ය ප්‍රාමිලා සේනානායක මහත්මිය (වමේ සිට 4 වෙනියා) සමඟ ජාතික මණ්ඩලයේ සහ කාර්ය මණ්ඩලයේ පිරිස

# HIV සමඟ ජීවත්වන්නන් සඳහා ආහාර බෙදා දීම




ඡායරූපයේ වමේ සිට: විශේෂඥ වෛද්‍ය කුලසිරි බුද්ධකෝරාල මහතා, HIV අධිවාචන ඒකකයේ අධ්‍යක්ෂිකා මදූෂා දිසානායක මහත්මිය, විශේෂඥ වෛද්‍ය දුලා ද සිල්වා මහත්මිය, ආර්ථික සංවර්ධන අමාත්‍යංශයේ ව්‍යාපෘති අධ්‍යක්ෂ ආර්. ඒ. ඩබ්. කුමාරසිරි මහතා, ගරු සභාපතිනි ප්‍රමිලා සේනානායක මහත්මිය, ආර්ථික සංවර්ධන අමාත්‍යංශයේ සහකාර ව්‍යාපෘති අධ්‍යක්ෂිකා ශාලිකා වීරවර්ධන මෙනවිය සහ ලංකා ජිලස් ආයතනයේ සභාපතිනි ෂෙරීන් රොද්‍රිගෝ මහත්මිය

ලෝක ආහාර වැඩසටහන යටතේ මුදල් අමාත්‍යංශයේ මෙහෙයවීමෙන් **HIV** සමඟ ජීවත්වන්නන් සඳහා ආහාර ද්‍රව්‍ය බෙදදීමේ වැඩසටහනේ සම්බන්ධීකරන කටයුතු **FPA** ශ්‍රී ලංකා අයතනය විසින් සිදු කරනු ලබයි.

මෙම ආහාර බෙදදීමේ කටයුතු තව දුරටත් විධිමත් කිරීමත් ලබාදෙන ආහාර වඩා ඵලදයී ලෙස භාවිත කිරීමත් පිළිබඳව දැනුවත් කිරීම සඳහා වැඩසටහනක් සංවිධානය කෙරිණි. ඡායාරූපයේ දැක්වෙන්නේ එහි අවස්ථාවකි.

## හොරණ Bodyline ආයතනයේදී

MAS හොල්ඩින්ග්ස් සමූහයේ කාන්තාවන් පෙරමුණට වැඩසටහන යටතේ ප්‍රජනක සෞඛ්‍ය පිළිබඳව තරුණ කාන්තාවන් දැනුවත් කිරීමේ වැඩ සටහන් මාලාවක් පවුල් සංවිධාන සංගමය හා එක්ව ක්‍රියාත්මක කරනු ලබයි. මේ යටතේ හොරණ Bodyline ආයතනයේ පැවති වැඩසටහනේ අවස්ථා...



වෛද්‍ය අධ්‍යක්ෂිකා සුමිත්‍රා තිසේරා මහත්මිය දේශනයක් පවත්වමින්

## යුධ හමුදව සඳහා වැඩසටහනක්



ආබාධිත රණවිරුවන් සහ ඔවුනගේ පවුල්වල අදය සඳහා ප්‍රජනක සෞඛ්‍ය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන් මාලාව 2010 වසර පුරා ලංකාවේ යුධ හමුද කඳවුරු බොහොමයක ඉතා සාර්ථකව සිදුකරන ලදි.

මේජර් ජනරාල් දයා රත්නායක මහතා පනාගොඩ යුධ හමුද කඳවුරේ පැවති වැඩසටහනකදී සභාව අමතන අවස්ථාව. හමුද නිලධාරීන් සහ සේවාවනිතා සමාජිකාවෝ මෙහි වෙති.




# යුවළ සම්බන්ධතා මගපෙන්වීම දෙරට වැඩුම

**විශේෂඥ මනෝ වෛද්‍ය කපිල රණසිංහ මහතා විසින් සම්පාදිත, FPA ශ්‍රී ලංකා මගින් ප්‍රකාශයට පත්කළ "යුවළ සම්බන්ධතා මගපෙන්වීම" ග්‍රන්ථය දෙරට වැඩුම ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී පසුගියද සිදුවිය.**



යුවල සම්බන්ධතා මග පෙන්වීම දෙරට වැඩුමේදී පැවති දේශන ඇසුරෙන් සකස් කරන ලද ලිපි ...




FPA ශ්‍රී ලංකා ගරු සභාපතිනි විශේෂඥ වෛද්‍ය ප්‍රාමිලා සේනානායක මහත්මිය විසින් එම ග්‍රන්ථය එහි කර්තෘ විශේෂඥ වෛද්‍ය කපිල රණසිංහ මහතා වෙත පිරිනැමූ අවස්ථාව. ඡායාරූපය වමේ සිට - නියෝජ්‍ය විධායක අධ්‍යක්ෂ ලසන්ත ගුණරත්න මහතා, විධායක අධ්‍යක්ෂ ගාමිණී වනසේකර මහතා, විශේෂඥ වෛද්‍ය හේමන්ත පෙරේරා මහතා සහ විශේෂඥ වෛද්‍ය ඩී. වී. ජේ. හරිස්චන්ද්‍ර මහතා

## ලිංගික කරුණු ගැන අවබෝධය ජනතාවට හොඳින් ලබා දිය යුතුයි.

### ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ ප්‍රසව හා නාරිවේද විශේෂඥ වෛද්‍ය හේමන්ත පෙරේරා



යුවළ සම්බන්ධතා සහ ලිංගික අවශ්‍යතා කියු විට අප හිතන්නේ ලිංගික අවයව ගැන. මොළය අපේ ප්‍රධානතම ලිංගික අවයවයයි. එයින් ඇතිවන හැඟීම් යම් කාර්යයකට යෙදවීමෙන් ලිංගික කාර්යයක් සිදුවේ. නමුත් මෙය විශාල පරාසයකට යන කාර්යයකි. පිරිමින්ගේ ලිංගික ප්‍රශ්න සැලකීමේදී අප විසින් කරගෙන යන සමීක්ෂණයකින් අනාවරණය වූයේ තෝරාගත් පිරිසෙන් 10% ක් යම් යම් ලිංගික ප්‍රශ්න ඇති බවයි. මේ ඒ අය තමන්ට ප්‍රශ්නයක් ඇතැයි හඳුනාගත් අයයි. නමුත් විවිධ රෝග තත්ත්වයන් ලෙස අප දකින දේ තුළ ලිංගික සම්බන්ධතා - යුවළ සම්බන්ධතා සහ පුද්ගලික ලිංගික ප්‍රශ්න ඇති බව බොහෝවිට හඳුනාගන්නේ නැහැ. මෙයින් ඇතිවී ඇති සමාජ ප්‍රශ්න දරුණුයි. නිදසුනක් ලෙස සැලකුවහොත් මේ කාලයේ බෙහෝවිට ස්ත්‍රීන්ට විරුද්ධ ප්‍රචණ්ඩත්වය ගැන කතා කරනව. කලාතුරකින් පිරිමින්ට විරුද්ධව ප්‍රචණ්ඩත්වය ගැනත් කතාකරනවා. නමුත් පීතෘ මූලික සමාජයේ මේ ප්‍රචණ්ඩත්වය අපට බොහෝ විට දක්නට ලැබෙනවා. එවැනි බොහෝ අවස්ථාවල ප්‍රචණ්ඩත්වය ඇති කළ පුද්ගලයා පොලිසියට රැගෙන ගොස් හිරකූඩුවේ දමා මේ ප්‍රශ්නය විසඳන්න අපි උත්සාහ කරනවා.

**"6 පන්තියේ ගැහැණු ළමයෙකුට, පිරිමි ළමයෙකුට තමන්ගේ ශරීරය ගැන දැනගන්න අයිතියක් නැත්ද?"**

"ඇයි මේ ප්‍රචණ්ඩත්වය ඇති වූයේ" කියා අප සොයා බලන්නේ නැහැ. සමහර වෙලාවට අප කියනවා මෙය මත්පැන් හා සම්බන්ධයි කියා. මත්පැන් මෙතරම් දුරට ලිංගික ක්‍රියාවලියට බලපානවාද යන්න ප්‍රමාණවත් අවබෝධයක් තිබෙනවාද? කපිල රණසිංහ මහතාගේ පොතේ සඳහන්වනවා දුම්පානය ගැන. දුම්පානයෙන් පිළිකා ඇතිවිය හැක; මරණයට පත්විය හැක. එමෙන්ම දුම්පානය ලිංගික බෙලහීනතාවට බලපෑ හැකිය යන්න සඳහන් කිරීම වටිනවා. පිරිමින් මේ පිළිබඳව බොහෝවිට දන්නේ නැහැ. මේ පිළිබඳ පණිවිඩ ජනතාවට ලැබෙන්නේ කෙසේද? මේ පිළිබඳ අධ්‍යයනය ලබාගන්නේ යාළුවන්ගෙන්, මිත්‍රයින්ගෙන්. එය අන්ධ කෙනෙක් තවත් අන්ධ කෙනෙක් පාරක් දිගේ එක්කරගෙන යනව වගේ වැඩක්.

**"දරුවෙක් ලැබෙන තුරු මවක් ලෝකයම බාර ගෙන තියෙනවා ආරක්ෂා කරන්න, නමුත් දරුවෝ ලැබුණාට පසු බලාගන්න කවුරුත් නැහැ..."**

මනුෂයින් වශයෙන් හරියාකාර අවබෝධයක් නැතිකම නිසා ඇතිවන ප්‍රශ්න නොයෙක් ලෙස බලපානවා. පවුලක දෙමව්පියෝ දෙන්නා අතර ඇති ප්‍රශ්න කෙළින්ම දරුවන්ට බලපානවා. කිසිම සැකයක් නොමැතිව විවාහ සංස්ථාව දෙදෙරායාමටද එය හේතු විය හැක.

මේ මානසික සෞඛ්‍යට බලපාන ප්‍රශ්නයකි. මේ ප්‍රශ්න දිගින් දිගටම පිටුපස්සෙන් එනවා. බොහෝවිට හඳුනාගන්නේ නැහැ. ජීවිතකාලය වෙනස් වනවිට, ළමා අවදියේදී හරියාකාරව, තමන්ගේ ශරීරයේ මේ අකාරයෙන් වෙනස්වන්නේ කෙසේද යන්න, කියා නොදුන්විට ළමයින් ඊළඟ අවදියට පත්වන්නේ වැරදි අවබෝධයක් ඇතිව හෝ කිසිම අවබෝධයක් නොමැතිව.

4 පිටුවට...

# ලිය සවිය ව්‍යාපෘතිය

## (Girl to Girl Project)

**අම්පාර හා මඩකලපුව දිස්ත්‍රික්කයන්හි තරුණියන් 2500ක් දැනුවත් කිරීම**

සැලසුම් කළ මාපියභාවය පිළිබඳ ජාත්‍යන්තර සම්මේලනයේ දකුණු ආසියා කලාපීය කාර්යාලය (IPPF - SARO) අනුග්‍රහයෙන් ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමය අම්පාර හා මඩකලපුව දිස්ත්‍රික්කයන් හි තෝරාගත් සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි කොට්ඨාශ 7ක මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබයි.

නව සන්නිවේදන උපක්‍රම භාවිත කරමින් අවුරුදු 25ට අඩු තෝරාගත් ගැහැණු ළමුන් පිරිසක් පුහුණු කිරීමෙන් පසු එම වයසේම 2500 ක පමණ තරුණ ගැහැණු ළමුන් වෙත ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය දැනුම ලබාදීම මෙමගින් සිදු කෙරේ.



ලිය සවියවැඩමුළුවක් අවසානයේදී එයට සහභාගී වු තරුණියන් පිරිස එහි සම්බන්ධීකරණ කටයුතු සිදුකරන කළමණාකාර නිහාල් නනායක්කාර මහතා (වම් කෙළවරේ) සහ කළමණාකාර පී. ජී. එන්. පී. දයාරත්න මහතා (දකුණු කෙළවරේ)



අම්පාර දිස්ත්‍රික්කයේ මහඔය, ලාහුගල, අම්පාර, උහන සහ මඩකලපුව දිස්ත්‍රික්කයේ චව්නතිව්, පඩිප්පලහි හා වාලච්චනෙ මේ සඳහා තෝරා ගෙන තිබේ.



වෛද්‍ය අධ්‍යක්ෂිකා සුමිත්‍රා තිසේරා මහත්මිය සහ නිවේදක අසේල බණ්ඩාරනායක වැඩසටහන මෙහෙයවමින්...

# රණවිරුවන්ගේ බිරින්දෑවරුන්ට උපදෙස්...

ශ්‍රී ලංකා යුද හමුදාවේ බුද්ධි අංශය මගින් සංවිධානය කරන ලද මියගිය රණවිරුවන්ගේ බිරින්දෑවරුන් සහ දරුවන් වෙනුවෙන් ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී පැවැත්වූ රණවිරු උපහාර උළලේදී රටවෙනුවෙන් දිවි පිදු රණවිරුවන්ගේ බිරින්දෑවරුන්හට, මවක් වශයෙන් තනිව දරුවන්ට රැකවරණය සැපයීමේදී මානසිකව ශක්තිමත්වීමටත් කායිකව නිරෝගීමත්ව සිටීමටත් අවශ්‍ය සෞඛ්‍ය උපදෙස් ලබාදීම සිදු කරන ලද අතර සියලුම දෙනාට FPA ශ්‍රී ලංකා ආයතනය මගින් එදින දිවා ආහාරය සඳහා දායකත්වය දක්වන ලදි.

... 3 පිටුවෙන්

6 පන්තියේ ගැහැණු ළමයෙක් කියන්නෙ කවුද? 6 පන්තියේ ගැහැණු ළමයෙක් කියන්නේ අවු. 11ක ළමයෙකි. ශරීරය වැඩි ඇති මල්වර වූ හෝ මල්වරවීමට සිටින ගැහැණු දරුවෙකි. ඒ දරුවාට ඒ දරුවාගේ ශරීරය ගැන ඒ දරුවගේ වයසේ පිරිමි ළමුන්ට තමන්ගේ ශරීරය ගැන දැනගන්න අයිතියක් නැද්ද?

ළමයින්ට, යෞවනයින්ට, විශ්ව විද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට, විවාහක අයට, පාසල් ළමුන්ට ප්‍රමාණවත් ලෙස දැනුම ලබා නොදීම ගැන අප වගකිව යුතුයි. මෙහි අවශ්‍යතාව රටේ පවතිනවා.

දරුවෙක් ලැබෙනතුරු මවක්, "මාතෘ මරණ අඩුකරමු - මවුවරු රැකබලා ගනිමු" කියා මුළුලෝකයම බාර අරගෙන තිබෙනවා ආරක්ෂා කරන්න. දරුවො ලැබුනට පසු බලා ගන්න කවුරුත් නැහැ. පසුව ඇය අාර්ථවහරණයට පත්වනවා, කිසිවෙක් නැහැ බලාගන්න. ඒ ඇතිවන ප්‍රශ්න ගැන කථා කරන්න කවුරුත් නැහැ; කැමති නැහැ.

"දරුවෙක් ලැබෙන්න ඉන්න අවස්ථාවේදී ලිංගික කටයුතුවල යෙදීමේ කිසිම හානියක් නැත" කියන පණිවිඩයවත් අපේ සමාජයට ලැබී නැහැ. එය කියනවිට පුදුමයෙන් වගේ අහන්නෙ.

සාමාන්‍යයෙන් පවුල් සංවිධාන සංගමයෙන් කරන්නේ පවුල් සැලසුම් කිරීමයි. දැන් එයින් ඔබ්බට ගිහින් තියෙනවා.

යම්කිසි දෙයක් එහි ඇති වැදගත්කම යටපත් වෙලා ඒකෙන් ඇතිවන හැගීම් ඉස්මතු වන විදිහට පණිවිඩයක් දී එයින් අපේ මාධ්‍ය අහන පිරිස, විකිණෙන ප්‍රමාණය වැඩිකර ගැනීම නොවෙයි කළ යුත්තේ. ඊට වඩා හුඟක් වගකීමෙන් කටයුතු කළ යුතුයි. විශේෂයෙන් මිනිසුන්ගේ සෞඛ්‍ය පිළිබඳව කථා කිරීමේ දී මාධ්‍යවේදීන් ලෙස වගකීමෙන් කටයුතු කළ යුතුයි.

මෙම පොත කියවනවිට තේරුම් ගත හැකියි කොයිතරම් සංයමයකින් යුතුව මෙම විෂය ඉදිරිපත් කළ හැකිද කියා. විශේෂඥ වෛද්‍ය කපිල රණසිංහ මහතා වැනි කෙනෙක් මෙවැන්නක් කිරීම ගැන මම ඉතාම ආඩම්බර වෙනවා.

# HIV / ඒඩ්ස් පිළිබඳව ප්‍රාදේශීය මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩමුළුව



HIV / ඒඩ්ස් පිළිබඳ දැනුම සහ අවබෝධය ජනතාව අතරට වඩාත් නිවැරදිව රැගෙන යාම ඉලක්ක කරනිමින්, ප්‍රාදේශීය මාධ්‍යවේදීන් ඒ පිළිබඳ දැනුවත් කිරීම සඳහා වැඩමුළුවක් FPA ශ්‍රී ලංකා ආයතනයේ අධිවාචන (Advocacy) ඒකකය, ජනමාධ්‍ය පර්ෂදය හා එක්ව සංවිධානය කෙරුණි. ප්‍රාදේශීය මාධ්‍යවේදීන් තිස්පස් දෙනෙකු පමණ මේ සඳහා සහභාගී වූහ.

මෙම අවස්ථාවට, හිටපු පුවත්පත් කොමසාරිස් එස්. දම්මුල්ල මහතා, ජාතික ලිංගාශ්‍රිත රෝග ඒඩ්ස් මර්දන වැඩ සටහනේ නියෝජ්‍ය අධ්‍යක්ෂිකා විශේෂඥ වෛද්‍ය සුජාතා සමරකෝන් මහත්මිය, ප්‍රජා වෛද්‍ය විශේෂඥ ජානකී විදනපතිරණ මහත්මිය, පවුල් සංවිධාන සංගමයේ නියෝජ්‍ය විධායක අධ්‍යක්ෂ ලසන්ත ගුණරත්න මහතා, අධිවාචන ඒකකයේ අධ්‍යක්ෂිකා මදුෂා දිසානායක මහත්මිය, Positive Women's Network සභාපතිනිය ප්‍රින්සි මංගලිකා මහත්මිය, ජනමාධ්‍ය පර්ෂදයේ ලේකම් රෝහණ සිරිවර්ධන මහතාද ඇතුළු පිරිසක් සහභාගී වූහ.

---

## ජංගම ප්‍රදර්ශනය පළමුවරට මහනුවරදී



ප්‍රජනක සෞඛ්‍ය පිළිබඳ ව ජනතාව අතරට තොරතුරු ගෙනයාම සඳහා සකස් කරන ලද ප්‍රදර්ශනය පසුගියද මහනුවර පැවති Knowledge First ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් කරන ලදි.

නව යෙවුන්වියේ වර්ධනයත් සමඟ සිදුවන වෙනස්කම්වල සිට පවුල් සැලසුම් ක්‍රම, HIV / ඒඩ්ස් සහ ලිංගිකව සම්ප්‍රේෂණය වන රෝග ආදී ඉතා වැදගත් සෞඛ්‍ය තොරතුරු රැසක් මෙයින් ඉදිරිපත් කෙරේ. ඉදිරියේදී ලංකාවේ ස්ථාන ගණනාවක මෙය පැවැත්වීමට නියමිතය.

## යාපනයේ අලෙවි ප්‍රවර්ධන කටයුතු





ත්‍රස්තවාදී ග්‍රහණයෙන් යාපනය ප්‍රදේශය මුදවා ගැනීමත් සමඟ ජන ජීවිතයේ කටයුතු අලුත් ප්‍රබෝධයකින් ඇරඹුණි. අපගේ අලෙවි අංශය ද යාපනයේ අලෙවි ප්‍රවර්ධන කටයුතු ආරම්භ කළේය. අලෙවි අංශයේ අධ්‍යක්ෂ සුහයිල් ජුනයිඩ් මහතා අතුලු පිරිස ඡායාරූපයේ වෙති.

---

...1 පිටුවෙන්

### Lisa 2010 **ව්‍යාපෘතිය . . .**

මෙම අවතැන්වූ පිරිස් කිලිනොච්චිය සහ මුලතිව් දිස්ත්‍රික්කයන්හි නැවත පදිංචි කරවීම සිදුකරන ලද අතර ව්‍යාපෘතියේ සේවාවන් එම ප්‍රදේශවලදී ක්‍රියාත්මක කරනු ලැබීය. පහසුකම් අඩු මෙම ප්‍රදේශවලට මෙවැනි සේවාවන් ලබාදීම එම දිස්ත්‍රික්කවල කටයුතු කරන වෛද්‍යවරුන්ගේ සහ රජයේ නිලධාරීන්ගේද විශේෂ පැසසුමට ලක් වූහ.

# පුවත් සංග්‍රහය

FPA SRI LANKA enriching relationships

www.fpasrilanka.org

37/27, බුලර්ස් පටුමග, කොළඹ 07.
දුරකථන: 011 2 555 455    ෆැක්ස්: 011 2 580 915
ඊ මේල්: fpa@fpasrilanka.org

ප්‍රජනක සෞඛ්‍ය පිළිබඳ තොරතුරු, වෛද්‍ය උපදෙස් හෝ උපදේශන සේවා ඔබ ඉන්නා තැන සිටම ලබාගැනීමට

අමතන්න 2 588 488

පිවිසෙන්න www.happylife.lk

SMS කරන්න 071 6408408

## අනාරක්ෂිත ගබ්සාවන් අවම කර ගැනීම



සැලසුම් නොකළ ගැබ් ගැනීම් සහ අනාරක්ෂිත ගබ්සාවන් සිදුවීම අවම කිරීම සඳහා ගතයුතු ක්‍රියා මාර්ග පිළිබඳ විද්වතුන්ගේ අදහස් විමසීම සඳහා හමුවක් ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමය සහ ශ්‍රී ලංකා ප්‍රසව හා නාරිවේද වෛද්‍යවරුන්ගේ සංගමය විසින් සංවිධානය කරන ලදි. මෙම අවස්ථාවට විශේෂඥ වෛද්‍යවරුන් සහ නීති ක්ෂේත්‍රයේ විද්වතුන් පිරිසක් සහභාගි වූහ.

## ගංවතුර ආධාර බෙදදෙමින්...



කොළඹ ප්‍රදේශයේ ස්ථාන කිහිපයක ගංවතුර ආධාර බෙදදීමට එක්වූ පාලන අධ්‍යක්ෂිකා කුසුම් ද සිල්වා මෙනවිය සහ මූල්‍ය අධ්‍යක්ෂිකා අනුෂා සංජීවනී මහත්මිය.

### ජ්‍යෙෂ්ඨ බාලදක්ෂිකාවන් සඳහා වැඩසටහන්

## අම්පාර සහ බදුල්ල දිස්ත්‍රික්කයන්හි 2000 ට වැඩි පිරිසකට දැනුම

ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමය හා ශ්‍රී ලංකා බාලදක්ෂිකා සංගමය ඒකාබද්ධව ක්‍රියාත්මක කරන ජ්‍යෙෂ්ඨ බාලදක්ෂිකාවන්ට ප්‍රජනක සෞඛ්‍යය සහ ලිංගික සම්ප්‍රේෂණ රෝග පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන 2010 වර්ෂය සඳහා අම්පාර සහ බදුල්ල දිස්ත්‍රික්ක දෙක තුළ ක්‍රියාත්මක විය.

2010 වර්ෂය සඳහා දැනුවත් කිරීම්වල ඉලක්කය වූයේ දිස්ත්‍රික්ක දෙකෙන්ම 2000 ක පමණ පිරිසකි. එම ඉලක්කය ට වඩා වැඩි කණ්ඩායමක් දැනුවත් කිරීමට හැකිවිය.



බදුල්ල පස්සර මධ්‍ය මහා විද්‍යාලයේ දී පැවැත්වූ අවසන් ලිඛිත පරීක්ෂණයට සහභාගි වූ බාලදක්ෂිකාවන්, ගුරුමහත්මීන් සමග... මෙම වැඩසටහන සම්බන්ධීකරණය FPA ශ්‍රී ලංකා ආයතනයේ අමරා ආර්. රණසූරිය මහත්මිය විසින් සිදු කරන ලදී.

## සෑම තරුණයෙක්ම තරුණියක්ම සෑම යුවළක්ම කියවිය යුතු පොතක්




විශේෂඥ මනෝ වෛද්‍ය
කපිල රණසිංහ මහතා විසින්
සම්පාදිත

**යුවළ සම්බන්ධතා මගපෙන්වීම**

සරසවි, සමුද්‍ර පොත්හල් වලින් සහ පවුල් සංවිධාන සංගමයේ ප්‍රධාන කාර්යාලයෙන් ලබාගත හැක.

## FPA ශ්‍රී ලංකා සම්පත් මධ්‍යස්ථාන

- අංක 584 B, ධර්මපාල මාවත, අම්පාර. දුරකථන: 063 4926664
- අංක 363, ත්‍රිකුණාමල පාර, මඩකලපුව. දුරකථන: 065 4923800
- අංක 79, 7 වෙනි පටුමග, නෙළුක්කුලම, මන්නාරම පාර, වව්නියාව. දුරකථන: 024 4924898

සංස්කරණය: ආනන්ද බෝධිනායක
සම්බන්ධීකරණය: අධිවාචන (Advocacy) ඒකකය

FPA ශ්‍රී ලංකා ප්‍රකාශනයකි